ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No .
දිනය / திகதி / Date. 2025.07.21

**පැමිණිලි අංකය : HRC/1650/23**

ජී.ජී.කේ. විද්‍යාරත්න
47, 1/1, සිරිධම්ම මාවත,
කොළඹ 10.

**පැමිණිලිකාර පාර්ශවය**

1. ලේකම්,
   සෞඛ්‍ය අමාත්‍යාංශය,
   කොළඹ 10.

2. අධ්‍යක්ෂ,
   වෛද්‍ය පර්යේෂණ ආයතනය,
   කොළඹ 08.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය : HRC/3159/24**

කේ. ජී. රත්න කුමාර
(ජී. ආර්. කේ. කළුගම්පිටිගේ)
ඉහළ ඇන්නරුව,
කිතලව.

**පැමිණිලිකාර පාර්ශවය**

1. ලේකම්,
   සෞඛ්‍ය අමාත්‍යාංශය,
   කොළඹ 10.

2. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
   (රසායනාගාර සේවා)
   සෞඛ්‍ය අමාත්‍යාංශය,
   කොළඹ 10.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

3. අධ්‍යක්ෂ,
   වෛද්‍ය පර්යේෂණ ආයතනය,
   කොළඹ 08.

4. ජී.ජී.කේ. විද්‍යාරත්න
   47, 1/1, සිරිධම්ම මාවත,
   කොළඹ 10.

**වගඋත්තරකාර පාර්ශවය**

__පසුබිම__

ඉහත අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.05.30 වන දින සිය නිර්දේශය ලබා දී ඇති අතර එකී නිර්දේශය ප්‍රකාරව අංක HRC/1650/23 දරණ පැමිණිල්ලේ පැමිණිලිකරු වන ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා 2024.07.04 වන දින සිට පත් කර ඇත. ඒ අනුව එම අවස්ථාව වන විට එකී තනතුරෙහි සේවය කළ කේ. ජී. රත්නකුමාර යන අය විසින් අංක HRC/1650/23 දරණ පැමිණිල්ලේ නිර්දේශය සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, අංක HRC/3159/24 දරණ පැමිණිල්ල ද කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇත.

තවද, කේ. ජී. රත්නකුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් මෙම කරුණට අදාළව අභියාචනාධිකරණයේ අංක CA (Writ) Application 696/2024 දරණ නඩුව ගොනු කර තිබූ අතර, එහි 5 වන වගඋත්තරකරු ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා වන විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමන් ද, 6 වන වගඋත්තරකරු ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් නිමල් ජී. පුංචිහේවා මැතිතුමන් ද, 9 වන වගඋත්තරකරු ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද නම් කර තිබුණි. එකී නඩුව 2024.12.10 වන දින කැඳවූ අවස්ථාවේ දී ඉහත කී අංක HRC/1650/23 දරණ පැමිණිල්ලේ නිර්දේශය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අභියාචනය සහ අංක HRC/3159/24 දරණ පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විභාගයට ගෙන ඇති බවත්, කඩිනමින් එහි තීරණයන් ප්‍රකාශයට පත් කිරීමට නියමිත බවත් අභියාචනාධිකරණය වෙත දැනුම් දීමෙන් අනතුරුව එම තීරණයන්ගෙන් අතෘප්තියට පත් වුවහොත් නැවත නඩු පැවරීමට ඇති අයිතිය කේ. ජී. රත්නකුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය සහ ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය විසින් රඳවාගෙන ඇති අතර, ඊට යටත්ව නඩු කටයුතු අවසන් කර ඇත.

ඉහත කී අංක HRC/1650/23 දරණ පැමිණිල්ලේ නිර්දේශය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අභියාචනය සහ අංක HRC/3159/24 දරණ පැමිණිල්ල තුළ සමාන කරුණු අන්තර්ගත වන බැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එකී පැමිණිලි දෙකම එකටගෙන විභාග කර ඇත.

මෙතින් සිට ඉහත සඳහන් අංක HRC/3159/24 දරණ පැමිණිල්ලට අදාළ ශීර්ෂය අනුව කරුණු දක්වා ඇත.

**පැමිණිලි අංකය : HRC/3159/24**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම.**

අංක HRC/1650/23 දරණ පැමිණිල්ලේ අභියාචක සහ අංක HRC/3159/24 දරණ පැමිණිල්ලේ පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර සිටින්නේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ (MRI) නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරු තුනක් ඇති බවත්, ඉන් එක් තනතුරක් සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම සඳහා දැන්වීමක් ප්‍රකාශයට පත් කර තිබූ බවත්, එහි "....මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පළමු වන ශ්‍රේණියේ පුරුෂ පක්ෂයේ නිළධාරීන් විය යුතුය...." යනුවෙන් සඳහන් කර තිබූ බවත්, ඒ අනුව නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අයදුම් කළ හැක්කේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පළමු වන ශ්‍රේණියේ පිරිමි පුද්ගලයන් හට පමණක් බව එකී දැන්වීමෙන් අවධාරණය තිබූ බවත් ය.

කෙසේ වෙතත් එකී තනතුර සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවකයකු නොවන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරයකු වන අංක HRC/1650/23 දරණ පැමිණිල්ලේ පැමිණිලිකරු සහ අංක HRC/3159/24 දරණ පැමිණිල්ලේ 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ විද්‍යාරත්න යන අය ද අයදුම්කර තිබූ බවත්, එකී ජී.ජී. කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේම වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයෙකු ලෙස සේවයේ නොකළ බැවින්, වෛද්‍ය පර්යේෂණ ආයතනයට කිසිදු සම්බන්ධයක් නැති ආයතනයකින් නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා පුද්ගලයෙකු පත් කිරීමට වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවකයන් විරුද්ධ වූ බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් සඳහන් කර ඇත.

එසේම, නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ යුතුකම් සහ වගකීම් ඉටු කිරීම සඳහා ආයතනය තුළ ඇති වෛද්‍ය රසායනාගාර සම්බන්ධයෙන් ගැඹුරු දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් අවශ්‍ය බවත්, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල ස්වාධීන වෙනම ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බවත්, ගුරුවරුන්ට හෙවත් ආචාර්යවරුන්ට එම තනතුරේ නිශ්චිත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය සුදුසුකම් නොමැති නමුත්, 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ විද්‍යාරත්න යන අය නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වී තිබූ බවත්, එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔහුට ලකුණු ලබාදී තිබූ බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර ඇත.

තවද, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා 2023.03.07 දින පැවති සම්මුඛ පරීක්ෂණය දෝෂ සහිත බැවින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඒ බව දැන්වීමෙන් පසු ලේකම් විසින් කරුණු සලකා බලා නැවත සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) මඟින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇති බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් සඳහන් කර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉහත සඳහන් උපදෙස් පරිදි 2023.05.26 දින දෙවන වර පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා පළමුවර 2023.03.07 දින පැවති පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයම සහභාගි වූ බවත්, විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් පසුව විධිමත් ලෙස නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා 2023.05.30 දින සිට තමා පත් කරන ලද බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් දක්වා ඇත.

ඉන් පසුව 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය විසින් 2023.03.07 දින පැවති සම්මුඛ පරීක්ෂණයෙහි ලකුණු මුල් කරගෙන අංක HRC/1650/23 දරණ පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොණු කර ඇති බවත්, එකී පැමිණිල්ලට අදාළව වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2023.08.24 දිනැති වාර්තාවේ සඳහන් පරිදි දෙවන වර පැවති විධිමත් සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසුකම් ලත් නිලධාරියා වන කේ.ජී. රත්න කුමාර මහතා පත්කළ බවට සිදු කර ඇති දැන්වීම මඟින් වලංගු සහ විධිමත් සම්මුඛ පරීක්ෂණය දෙවන වර 2023.05.26 දින පැවති සම්මුඛ පරීක්ෂණය බව වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින්ම පිළිගෙන ඇති බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර ඇත.

එසේ තිබියදී 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ විද්‍යාරත්න යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව නොමඟ යවමින් අවලංගු සම්මුඛ පරීක්ෂණයකට අදාළ කරුණු ඉදිරිපත් කර ඔහුගේ පැමිණිලි අංක HRC/1650/23 සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් නිර්දේශයක් ලබාගෙන ඇති බවත්, එකී නිර්දේශය ප්‍රකාරව 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා පත් කිරීම තුළින් තමා දැරූ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර අභියෝගයට ලක් වූ බවත්, එසේහෙයින් පැමිණිලි අංක HRC/1650/23 සඳහා අභියාචනයක් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2024.07.08 දින යොමු කළ බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් සඳහන් කර ඇත.

තවද, අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී අංක HRC/3159/24 දරණ පැමිණිල්ලේ පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් පළමුව පැවති සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දී ඇති ලකුණු වල ඇති දෝෂ සහිත බව, චක්‍රලේඛන අනුව ක්‍රියා කර නොමැති බව සහ 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති බව පැහැදිලි කරන ලද නමුත්, එම කරුණු සැලකිල්ලට නොගෙන මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශයක් ලබාදීම තුළින් තමා අගතියකට පත් වූ බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර ඇත.

නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අයදුම් කළ හැක්කේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පළමු වන ශ්‍රේණියේ පිරිමි පුද්ගලයන් හට පමණක් බව සඳහන්ව තිබිය දී වෙනත් ආයතනයක් වන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලෙහි සේවය කරන අයෙකු වෙත එම තනතුර ලබා දීම සුදුසු නොවන බවත්, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කළ අංක 01-46/2017 සහ 2017.08.24 දිනැති චක්‍ර ලේඛනය මඟින් වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වෙන් වෙන් ආයතන දෙකක් බව සඳහන් කර ඇති බවත්, වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල ආයතන දෙකක් වීම හේතු කොට ගෙන එක් එක් ආයතනයන් සඳහා වෙන වෙනම සේවක සංඛ්‍යාවක් සිටින බවත්, වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල සඳහා වෙනම වැය ශීර්ෂ දෙකක් ඇති බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර ඇත.

තවද, වෛද්‍ය පර්යේෂණ ආයතනය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) යටතේ පවතින ආයතනයක් වන අතර වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන පුහුණු සහ පර්යේෂණ) යටතේ පවතින ආයතනයක් වන බවත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලියන ලද "MANUAL OF THE DEPARTMENT OF HEALTH, PART III, LABORATORY SERVICES, Chapter 1 -ADMINISTRATION" පිටු අංක 1හි සඳහන්ව ඇති බවත්, පිටු අංක 2හි දෙපාර්තමේන්තුවක් නොවන බව පැහැදිලිව සඳහන්ව ඇති බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් දක්වා ඇත.

තවද, වෙනම තනතුරක් ඇරීම හේතු කොටගෙන ස්ථානමාරු ගැනීමේදී ද ආයතන සංග්‍රහය අනුව ක්‍රියා කළ යුතු වන අතර එවිට මුල් තනතුර වන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර වෙත පැමිණිය යුතු වුවද, 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ විද්‍යාරත්න යන අය විසින් එවැනි කිසිවක් අනුගමනය කර නොමැති බැවින් ආයතන සංග්‍රහය පවා උල්ලංඝණය කර ඇති බවත්, නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්ය

තනතුර යන තනතුරු දෙකම පූර්ණකාලීනව රාජකාරි කළ යුතු තනතුරු වන බැවින් එක් තනතුරක් දරමින් අනෙක් තනතුරෙහි රාජකාරි කිරීමට නොහැකි බවත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලියන ලද "MANUAL OF THE DEPARTMENT OF HEALTH, PART III, LABORATORY SERVICES, Chapter VI - LIST OF DUTIES OF MEDICAL RESEARCH INSTITUTE STAFF " 48-49 හි නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර පූර්ණකාලීනව රාජකාරි කළ යුතු තනතුරක් බව පැහැදිලිව සඳහන්ව ඇති බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් නැවත සම්මුඛ පරීක්ෂණයක් කැඳවීම සඳහා ලිපි අංක: MRI/EB/MLT/2017(1) සහ 2023.04.17 දිනැතිව නිකුත් කළ ලිපිය මගින් ආයතනයේ සේවය කරන නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවීමේදී පුහුණු පාසලෙහි සේවයෙහි නියුතු නිලධාරීන්ගේ නම් ඇතුලත් කර නොමැති බවත්, එබැවින් වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ පුහුණු පාසල ආයතන දෙකක් බව එම ලිපිය මගින් තහවුරු වන අතර ආයතනයේ අධ්‍යක්ෂ විසින් ද එම කරුණ පිළිගෙන ඇති බවත්, 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේම වෛද්‍ය රසායනාගාර විද්‍යාඥයෙකු ලෙස සේවය නොකළ බැවින්, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ දෛනික රාජකාරි සඳහා කිසිදු සම්බන්ධයක් නැති පුද්ගලයෙකු වන බවත්, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ (MRI) නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ යුතුකම් සහ වගකීම් සඳහා ආයතනය තුළ ඇති වෛද්‍ය රසායනාගාර වල ගැඹුරු දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් අවශ්‍ය බව අවධාරණය කර ඇති බවත්, එම තනතුරේ ප්‍රධාන රාජකාරියක් වන්නේ ආයතනය තුළ ඇති දේපළ ඉබි යතුරු ආරක්ෂා කිරීම සහ දිනය මුළුල්ලේම වෛද්‍ය රසායනාගාරයේ කාර්යයන් සහ කර්තව්‍යයන් අධීක්ෂණය කිරීම බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් තවදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද, වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දී ඇති ආකාරය දෝෂ සහිත බවත්, විනිවිද භාවයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයකදී ලකුණු ලබා දීමේ ක්‍රමය හෝ නිර්ණායක ප්‍රසිද්ධ කළ යුතු වුවද එසේ ප්‍රසිද්ධ නොකිරීමෙන් අවිධිමත්භාවයක් හා විනිවිද භාවයෙන් තොර බවක් නිරූපණය වන බවත්, අත්තනෝමතික ලෙස ලකුණු ලබාදීමක් සිදු කර ඇති බවත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DDG/LS/EC/MRI/327/2023 සහ 2023.04.10 දිනැති ලිපි ලිපිය අනුව 2023.05.26 දින පැවත්වූ සම්මුඛ පරීක්ෂණයකින් පසුව විධිමත් ලෙස ලිපි අංක MRI/EB/MLT/2017(1) යටතේ පත් වූ මාගේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරෙහි වැඩ කටයුතු 2024.07.04 දිනෙන් පසු නවත්වන ලෙස දැන්වීම මගින් තමා හට බලවත් අගතියක් සිදු වූ අතර එබැවින් අංක HRC/HO/3159/24 දරණ පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කළ බවත්

පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර ඇත.

එසේහෙයින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා තමා පත් කර තිබූ බැවින් 2024.07.04 දින සිට බලපාන පරිදි එකී තනතුරෙහි කටයුතු කළ හැකි බවට නිර්දේශයක් ලබාදෙන ලෙසත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දෝෂ සහිත කරුණු පදනම් කරගනිමින් අංක: HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව ලබා දුන් නිර්දේශය අවලංගු කිරීමට නිර්දේශයක් ලබාදෙන ලෙසත්, 4 වන වගඋත්තරකරු වන ජී. ජී. කේ. විද්‍යාරත්න යන අය නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරෙහි සේවය කිරීම 2024.07.04 දින සිට බලපාන පරිදි අවලංගු කිරීමට නිර්දේශයක් ලබාදෙන ලෙසත්, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් හට පමණක් නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරට අයදුම් කිරීමට අවසර දී අනෙකුත් ආයතන වලින් (වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වැනි) අයදුම්පත් භාර නොගන්නා ලෙසට වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත නිර්දේශයක් ලබාදෙන ලෙසත්, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින්ගෙන් හැර අනෙකුත් තනතුරු දරන්නන්ගෙන් අයදුම්පත් නොකැඳවීමට කටයුතු කරන ලෙසට වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත නිර්දේශයක් ලබාදෙන ලෙසත් පැමිණිලිකරු වන කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>1 වන වගඋත්තරකාර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ 2 වන වගඋත්තරකාර සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා)ගේ කරුණු දැක්වීම.</u>

1 වන සහ 2 වන වගඋත්තරකරුවන් වෙනුවෙන් 2 වන වගඋත්තරකාර සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) වෛද්‍ය පී. එල්. අතපත්තු මහතා විසින් අංක DDG/LS/GENERAL/445/2024 සහ 2025.03.06 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් වෛද්‍ය පර්යේෂණායතනයේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා සෞඛ්‍ය ලේකම්තුමාගේ එකඟතාව ඇතිව 2023. 03. 17 දින අයදුම්පත් කැඳවා ඇති බවත්, එම අයදුම්පත් වලට අනුව සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද බවත් සඳහන් කර ඇත.

එසේම, ඒ අතරතුර හෝ ඉන් පසුව වෛද්‍ය පර්යේෂණායතනය තුළ සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතු බවටත්, වෙනත් ආයතනවල සේවය කරන නිලධාරීන්ට මේ සඳහා අයදුම් කළ නොහැකි බවටත් විරෝධතාවක් ගොඩ නැගී ඇති බවත්, වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙනම ආයතනයක් වන බවත්, මෙම නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරී තනතුර සඳහා මුළු ලංකාවෙන්ම අයදුම්පත් කැඳවීමක් සිදු නොවන බවත්, ආයතනය තුළින්ම පමණක් අයදුම්පත් කැඳවීම සාමාන්‍යයෙන් සිදුවන බවත්, ඒ

අනුව සෞඛ්‍ය ලේකම් විසින් වෛද්‍ය පර්යේෂණායතනයේ සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවන ලෙස උපදෙස් ලබා දී ඇති බවත් එකී වාර්තාව ප්‍රකාරව 2 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර පූර්ණ කාලීන තනතුරක් වන බැවින් මෙම තනතුර සඳහා තේරී පත්වන නිලධාරියා පුහුණුවලත් අයෙකු විය යුතු වන බවත්, පැය 24 පුරා එම තනතුරට අදාළ රාජකාරි කළ යුතු වන බවත්, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වෙනම ආයතනයක් වන බවත්, ඒ බව සෞඛ්‍ය ආයතන වර්ගීකරණයකට ලක් කර සෞඛ්‍ය ලේකම් විසින් 2015 දී නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුවද පෙනී යන බවත්, එහි ඉගැන්වීම් කරන නිලධාරියෙකු නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරෙහි සේවයට පැමිණීමේදී ගැටළු ඇති විය හැකි බැවින් මේ සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනය තුළ සේවය කරන නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවන ලෙසට සෞඛ්‍ය ලේකම් විසින් උපදෙස් ලබා දී ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් ඉහත කී වාර්තාවේ සඳහන් කර ඇත.

සෞඛ්‍ය ලේකම්ගේ උපදෙස් අනුව වෛද්‍ය පර්යේෂණ ආයතනය තුළ සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන්ගෙන් පමණක් දෙවනවර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා මෙම තනතුරට සුදුස්සෙකු තෝරා පත් කර ගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) මහතා තේරී පත්ව ඇති බවත්, දෙවන සම්මුඛ පරීක්ෂණය පවත්වා සුදුස්සෙකු තෝරා පත් කර ගැනීමෙන් පසු පළමු සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වූ වෛද්‍ය පර්යේෂණායතනයෙන් බාහිර ආයතනයක් වන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී. ජී. කේ. විද්‍යාරත්න මහතා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එහිදී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වෛද්‍ය පර්යේෂණායතණයෙන් පමණක් කරුණු විමසා (ඒක පාර්ශවිකව) ඒ අනුව නිර්දේශ ලබා දී ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, එකී නිර්දේශ සෞඛ්‍ය ලේකම් වෙත ලබා දී සම්මත ක්‍රමවේදයට අනුව සෞඛ්‍ය ලේකම්ගේ උපදෙස් ලබා ගෙන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා)ගේ ද උපදෙස් මත තීරණයක් ගත යුතුව තිබූ නමුත්, මෙහිදී සිදු වී තිබෙන්නේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දෙන ලද නිර්දේශ අනුව තමා විසින් තීරණයක් ලබා ගෙන මෙම තනතුර සඳහා කේ. පී. ජී. රත්න කුමාර මහතා තෝරා පත්කර ගැනීම වන බවත්, මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලේකම් වෙත කරන ලද නිර්දේශ පරිදි තීරණයක් ගැනීම සෞඛ්‍ය ලේකම්ගෙන් විමසා වෛද්‍ය පර්යේෂණායතනය විසින් කළ යුතුව තිබූ බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

වෛද්‍ය පර්යේෂණායතනයේ තොරතුරු වලට අනුව මෙම තනතුර සඳහා දෙපාර්ශවයෙන්ම නිලධාරීන් තේරී පත් වී ඇති බව නිරීක්ෂණය වන බවත්, අයදුම්පත් කැඳවීම සිදු කර තිබෙන ආකාරය

විමසීමේ දී ඒ සඳහා වෛද්‍ය පර්යේෂණායතනයේ සේවය කරන නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවීමට කටයුතු කර තිබෙන බව පෙනී යන බවත්, සෞඛ්‍ය ලේකම් විසින් 2017 දී නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුව සෞඛ්‍ය ආයතන වර්ගීකරණයකට ලක් කර තිබෙන බවත්, එම චක්‍ර ලේඛයට අනුව වෛද්‍ය පර්යේෂණ ආයතනය හා රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වෙනම ආයතන දෙකක් බව පෙනී යන බවත්, මෙම තනතුර සඳහා වෛද්‍ය පර්යේෂණායතනයෙන් පමණක් අයදුම්පත් කැඳවන්නේ නම් වෙනත් ආයතනයක සේවය කරන නිලධාරියෙකු තෝරාපත් කර ගත නොහැකි බව නිරීක්ෂණය වන බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

මෙම නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පත් වීමක් නොවන අතර සෞඛ්‍ය ලේකවරයා විසින් පත් කරනු ලබන අභ්‍යන්තර පත්වීමක් බවත්, එබැවින් සෞඛ්‍ය ලේකම්තුමාගේ උපදෙස් අනුව කරන ලද පත්කිරීම අනුව වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවය කරන පූර්ණ කාලීනව මෙම සේවයේ යෙදිය හැකි නිලධාරියෙකු පත් කිරීම සුදුසු බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව ප්‍රකාරව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**<u>3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂගේ කරුණු දැක්වීම.</u>**

3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2024.07.18 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ රාජකාරී ස්වභාවය අනුව එය කාර්යක්ෂමව සහ අඛණ්ඩව පවත්වා ගෙන යාමේ පහසුව සඳහා නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරු 03ක් පවත්වා ගෙන යනු ලබන බවත්, මෙම තනතුර පැය විසි හතර පුරාවට ක්‍රියාත්මක තනතුරක් වන අතර මෙම තනතුරෙහි සේවය කරනු ලබන නිලධාරීන් සිය නිත්‍ය තනතුරට අමතරව මෙම තනතුරෙහි රාජකාරි වල යෙදෙන බවත් ය.

මෙම නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරු දැරූ නිලධාරීන් අතුරින් එක් නිලධාරියෙකු වයස අවුරුදු හැට සම්පූර්ණ වීම මත 2023.03.19 දින සිට විශ්‍රාම ගන්වා ඇති බවත්, ඒ අනුව නැවත නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරියකු පත් කර ගැනීම සඳහා 2023.02.03 දිනැති ලිපිය මඟින් අයදුම්පත් කැඳවූ බවත්, එම අයදුම්පත් ඇගයීම සඳහා නිලධාරීන් පස් දෙනෙකුගෙන් යුක්ත වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් 2023.03.07 දිනැති ලිපිය මඟින් පත් කර ඇති බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

මෙම නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අතර ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2023.03.07 දින පැවැත්වූ බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පරීක්ෂා කරන ලද නිර්ණායක අනුව වැඩි ලකුණු ලබා ගත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්යවරයකු ලෙස සේවය කරනු ලබන ජී. ජී. කේ. විද්‍යාරත්න මහතා මෙම තනතුර සඳහා නිර්දේශ කර ඊට අදාළ වාර්තාව 2023.03.09 දිනැතිව

වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර තිබූ බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම,නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා ජී.ජී.කේ. විද්‍යාරත්න මහතා පත් කිරීම සම්බන්ධයෙන් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන්ගෙන් විවිධ මතවාද ඉදිරිපත් වී තිබූ බවත්, එම මතවාද සහිත ලිපි, 2023.03.16 දිනැති ලිපිය මගින් නැවත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත යොමු කරන ලද බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්යවරයකු ලෙස සේවය කරන ජී.ජී.කේ. විද්‍යාරත්න මහතා නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා සුදුසු බව නැවත නිර්දේශ කර යොමු කර තිබූ බවත් 3 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

එසේ හෙයින් අදාළ පත් කිරීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා 2023.03.30 දිනැතිව ලිපියක් යොමු කරන ලද බවත්, සෞඛ්‍ය ලේකම් විසින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ රසායනාගාර වල සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව ඉල්ලුම්පත් කැඳවන ලෙස දන්වා තිබූ බවත්, අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛනය ද ඒ සමඟ අමුණා එවා තිබූ බවත්, ඒ අනුව මෙම ආයතනයේ රසායනාගාරයන්ට අනුයුක්ත නිලධාරීන්ගෙන් 2023.04.17 දිනැති ලිපිය මගින් නැවත අයදුම්පත් කැඳවූ බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, ඉහත කී ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ නම් සඳහන් නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු පමණක් අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අතර එය ඇගයීම සඳහා නැවත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත 2023.05.23 දිනැති ලිපිය මගින් යොමු කර ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ 2023.05.29 දිනැති නිර්දේශය අනුව මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී. ආර්. කේ. කළුගම්පිටිය මහතා මෙම තනතුර සඳහා සුදුසු බව නිර්දේශ කර තිබූ බවත්, ඒ අනුව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ කේ.ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) මහතා නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අංක MRI/EB/MLT/2017(1) සහ 2023.05.29 දිනැති ලිපිය මගින් පත් කිරීමට කටයුතු කළ බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේවුවද, එම පත් කිරීම සම්බන්ධව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්යවරයකු ලෙස සේවය කරන ජී. ජී. කේ. විද්‍යාරත්න මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර ඊට අදාළව 2024.05.30 දිනැති නිර්දේශය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දී තිබූ බවත්, එම නිර්දේශය සම්බන්ධව සලකා බැලීම සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නිලධාරීන් අතුරින් කමිටුවක් පත් කළ බවත්, එම කමිටු වාර්තාවට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය සම්බන්ධව විරෝධයක් නොමැති බව දන්වා තිබූ බවත් 3 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

කෙසේ වුවද වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්යවරයකු ලෙස සේවය කරන ජී. ජී. කේ. විද්‍යාරත්න මහතා 2023.05.30 දින සිට මෙම තනතුර සඳහා පත් කිරීමේදී එකී කාලයට අදාළව ආයතනික ගැටළු මතු විය හැකි බැවින්, උදාහරණ ලෙස මෙම මහතා එකී කාල සීමාව තුළ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරේ සේවය නොකිරීම සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) මහතා මෙම තනතුරේ සේවය කරන අවස්ථාවේ ඔහු විසින් කරන ලද රාජකාරී (අධිකරණ වෛද්‍ය සාම්පල් ආදිය ලබා ගැනීම) සඳහා වග වීම පිළිබඳ ගැටළුකාරී තත්වයක් ඇති වන බැවින් 2024.07.04 සිට වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්යවරයෙකු ලෙස සේවය කරන ජී. ජී. කේ. විද්‍යාරත්න මහතා මෙම තනතුර සඳහා පත් කිරීම සුදුසු බව නිරීක්ෂණය වූ බවත්, ඒ අනුව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ආචාර්යවරයෙකු ලෙස සේවය කරන ජී.ජී.කේ.විද්‍යාරත්න මහතා 2024.07.04 දින සිට මෙම තනතුර සඳහා පත් කරන ලද බවත් 3 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

**<u>4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අයගේ කරුණු දැක්වීම.</u>**

2025.04.02 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ තමා 2014.03.24 වන දින සිට වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරයෙකු ලෙස සේවය කරන බවත්, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2023.02.03 දිනැති ලිපිය මගින් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා අයදුම්පත් කැඳවා තිබූ බවත්, තමා ද ඒ සඳහා අයදුම් කළ බවත් ය.

එසේම, එකී තනතුරට අදාළ සම්මුඛ පරීක්ෂණය 2023.03.07 වන දින පැවැත්වූ බවත්, එහිදී තමා හට ලකුණු 91.4ක් හිමි වූ බවත්, එය වැඩිම ලකුණු ප්‍රමාණය වූ බැවින් තමා හට අදාළ තනතුර හිමි විය යුතු වුවත් එකී තනතුර ලබා නොදී නැවත අයදුම්පත් කැඳවා 2023.05.29 වන දින සිට පැමිණිලිකරු වන කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය එකී තනතුර සඳහා පත් කළ බවත්, 2023.03.07 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී ඉහත කී කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය තමාට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබූ බැවින් එලෙස "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කිරීම යුක්ති සහගත නොවූ බැවින් තමා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අංක HRC/1650/23 දරණ පැමිණිල්ල ගොනු කළ බවත් 4 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, එකී අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.05.30 දිනැතිව නිර්දේශයක් ලබා දෙනු ලැබූ බවත්, එකී නිර්දේශය ප්‍රකාරව අංක MRI/EB/MLT/2017(1) සහ 2024.07.04 දිනැති ලිපිය මගින් තමා "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් පත් කරනු ලැබූ බවත්, එම තනතුර සඳහා මුලින් පත් කරන ලද කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ)

යන අය හට අදාළ පත්වීම ලබා දී ඇත්තේ 2023.05.30 වන දින සිට එක් වසරක කාලයකට පමණක් බවත්, ඒ අනුව තමා හට පත්වීම ලබා දුන් 2024.07.04 වන දින විට කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අයගේ වසරක කාලය අවසන්ව තිබූ නමුත්, මෙම තනතුර දරන්නා වෙත හිමිවන නිල නිවස තමා වෙත ලබා දීමට කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය කටයුතු නොකළ අතර මේ වන තෙක් ඔහු එය භුක්ති විඳින බවත් 4 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, 4 වන වගඋත්තරකරු විසින් 2025.02.06 දිනැතිව කොමිෂන් සභාව වෙත ලේඛන ඉදිරිපත් කරමින් සහ 2025.04.02 දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේ දී කරුණු දක්වමින් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල, වෛද්‍ය පර්යේෂණ ආයතනය යටතේ පවතින ආයතනයක් බවත් වෙනම ආයතනයක් නොවන බවත් දක්වා ඇත. එහිදී ආයතනික ව්‍යුහය ඇතුළත් සටහනක් ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලෙහි ප්‍රධානියා වන විදුහල්පතිවරයා කටයුතු කරනු ලබන්නේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ යටතේ බව දක්වා ඇත.

එසේම, අංක MRI/SFC/COM/2024 සහ 2024.11.13 දිනැතිව වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ගණකාධිකාරී විසින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද ලිපියක පිටපතක් 4 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එකී ලිපිය ප්‍රකාරව වෛද්‍ය පර්යේෂණ ආයතනයට වෛද්‍ය සැපයුම් අංශයෙන් (LCB 0000307) "ස්වස්ථ" (SWASTHA) මෙහෙයුම් පද්ධතිය හරහා ලබා ගන්නා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සහ පාරිභෝජ්‍ය නොවන ද්‍රව්‍ය ආයතනයේ අංශ වලට බෙදා දීමේදී වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල ද ඇතුලත්ව ඇති බවත්, වෛද්‍ය පර්යේෂණ ආයතනයට අයත් ප්‍රධාන ගබඩාවේ ප්‍රධාන ඉන්වෙන්ට්‍රි තොග පොත අනුව උපලේඛන ගත කර ඇති අංශ අතරින් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල ද එයට ඇතුලත්ව ඇති බවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය පර්යේෂණ ආයතනයට 111 වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබාදෙන අතර, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලද වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ යටතේ පාලනය වන බැවින් එකම වැය ශීර්ෂය යටතේ (111011) ආපදා ණය මුදල ලබා දීමට කටයුතු සිදු කර ඇති බවත් සඳහන්ව ඇත.

තවද, 4 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර සිටින්නේ තමාට පෙර ද වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරුන් සේවය කළ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් විසින් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත්ව කටයුතු කර ඇති බවයි. ඒ බව සනාථ කිරීම සඳහා අශෝක චන්ද්‍රසිරි බන්දුල ජයවර්ධන යන අය වෙතින් ලබාගත් 2024.11.09 දිනැති දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත.

එකී දිව්රුම් ප්‍රකාශය අනුව අශෝක චන්ද්‍රසිරි බන්දුල ජයවර්ධන යන අය කොළඹ 08, රිජ්වේ ආර්යා ළමා රෝහලේ රසායනාගාරයේ වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයෙකු ලෙස පත්වීම් ලබා

1993.02.01 දින දක්වා සේවයේ නියුතුව සිටි බවත්, රිජ්වේ ආර්යා ළමා රෝහලෙන් ස්ථාන මාරුවීම් ලබා වෛද්‍ය පර්යේෂණායතනයේ වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසැලේ ආචාර්ය වරයෙකු ලෙස වර්ෂ 1993.02.01 දින පත්වීම් ලබා එහි සේවයට වාර්තා කළ බවත්, එලෙස සේවයේ යෙදී සිටියදී වෛද්‍ය පර්යේෂණායතනයේ නේවාසික වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වී 1999 ජනවාරි මස සිට 1999.08.15 දින දක්වා වෛද්‍ය පර්යේෂණායතනයේ නේවාසික වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥ තනතුරෙහි සේවය කළ බවත්, වෛද්‍ය පර්යේෂණායතනයේ නේවාසික වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥ තනතුර දරණ කාලය තුලදී එම තනතුරට හිමි DXA/5/2 නිළ නිවාසයෙහි පදිංචි වී සිටි අතර එම රාජකාරි කටයුතු සඳහා හිමි අතිකාල දීමනා ද ලැබූ බවත් සඳහන් කර ඇත.

එසේහෙයින් 4 වන වගඋත්තරකරු වන ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය සඳහන් කර සිටින්නේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් තමා විසින් සම්පූර්ණ කර ඇති බවත්, 2023.03.07 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගනිමින් එකී තනතුර සඳහා සුදුසුකම් ලැබුවේ තමා වන බැවින් එකී තනතුරෙහි කටයුතු ඉටු කිරීමට තමාහට අවකාශය ලැබිය යුතු බවත්, එකී තනතුරට හිමි නිල නිවස තමා වෙත ලබා දී මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය ඉන් ඉවත් විය යුතු බවත් ය.

තවද, පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෙත, 2025.04.02 වන දින පැවති පරීක්ෂණයේ දී ඔහු වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා කාලය ලබාදෙන ලෙස සිදු කරන ලද ඔහුගේ ඉල්ලීම අනුව සති දෙකක කාලයක් ලබා දී ඇති අතර එකී කාල සීමාව තුළ ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අපහසුතාවයක් පවතින බැවින් කාලය දීර්ඝ කරන ලෙසට 2024.04.16 දිනැති ලිපිය මගින් 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය විසින් නැවත ඉල්ලීමක් සිදු කර ඇත. නැවතත් 2025.04.30 දිනැතිව ලිපියක් යොමු කරමින් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට 2025.05.31 දක්වා කාලය ලබාදෙන ලෙසට 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය විසින් නැවතත් ඉල්ලා ඇත. එසේම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) විසින් අංක LO/382/24 සහ 2025.05.27 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරමින් ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෙත අදාළ කරුණු දැක්වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන ලෙසට ඉල්ලා ඇත. කෙසේනමුත් අදාළ පරීක්ෂණය පැවති 2025.04.02 වන දින සිට මේ වන තෙක් (2025.07.21 වන දින තෙක්) මාස තුනකට අධික කාලයක් ගතව ඇතත් 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය විසින් සිය ලිඛිත දේශන ඉදිරිපත් කර නැත.

## නිරීක්ෂණ

වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා 2023.02.03 වන දින අයදුම්පත් කැඳවා ඇති බවත්, එකී අයදුම්පත් කැඳවීමට අදාළ දැන්වීම තුළ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ"තනතුර සඳහා අදාළ වන මූලික සුදුසුකම් ලෙස

i. මෙම ආයතනයේ සේවයේ නියුතු,
ii. වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ,
iii. පළමු ශ්‍රේණියේ පුරුෂ පක්ෂයේ නිලධාරීන් විය යුතු බවට දක්වා ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, මෙම තනතුරට අදාළව 2023.03.07 වන දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇති අතර එහිදී ඉදිරිපත් වූ අයදුම්කරුවන් දෙදෙනා අතරින්, 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය ලකුණු 91.4 ක් සහ පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය ලකුණු 77.6ක් ද ලබාගෙන ඇති බව 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පෙනී යයි.

ඒ අනුව වැඩි ලකුණු ලබාගත් 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෙත පත්වීම ලබාදීමට පෙර, ඔහු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු තැනැත්තෙක් නොවන බවටත්, ඔහු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරයෙකු ලෙස සේවය කරන අයෙකු වන බැවින් ඉහත කී මෙම තනතුරට අදාළ පළමු සුදුසුකම වන 'මෙම ආයතනයේ සේවයේ නියුතු' යන සුදුසුකම ඔහු විසින් සපුරා නොමැති බවට වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන්ගෙන් විරෝධතාවයන් ඉදිරිපත් වී ඇති බවත්, මේ හේතුවෙන් 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2023.03.16 දිනැති ලිපිය මගින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත එකී විරෝධතා ලිපි යොමු කර එම ලිපි සම්බන්ධයෙන් අවධානය යොමු කර නැවත සුදුසු නිර්දේශයක් ලබාදෙන ලෙසට දන්වා ඇති බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 2023.03.27 දිනැති ලිපිය මගින් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය තෝරා ගැනීම සුදුසු බව නැවත නිර්දේශ කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2023.03.30 දිනැති ලිපිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරමින් මතුව ඇති ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා නිලධාරියෙකු පත් කරගැනීමට සුදුසු ක්‍රමවේදයක් පිළිබඳව උපදෙස් ඉල්ලා ඇති බවත්, එහිදී වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික

විද්‍යාඥයන් අතරින් ජ්‍යෙෂ්ඨත්වය මත නිලධාරියෙකු පත් කරගන්නා ලෙසට උපදෙස් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2023.04.17 දිනැති ලිපිය මගින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නවදෙනෙකුගෙන් යුත් නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් අදාළ තනතුර සඳහා අයදුම් කරන ලෙසට දැනුම් දී ඇති බවත්, එම නිලධාරීන් අතරින් මුල් සම්මුඛ පරීක්ෂණය සඳහා ද ඉදිරිපත් වූ පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය පමණක් අයදුම් කර ඇති බවත්, ඊට අදාළව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය 2023.05.26 වන දින රැස්වී ඇති අතර, එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 2023.05.29 දිනැති ලිපිය 3 වන වගඋත්තරකරු වෙත යොමු කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා එක් අයදුම්කරුවෙකු පමණක් ඉදිරිපත් වී ඇති බැවින් සම්මුඛ පරීක්ෂණයක් අවශ්‍ය නොවන බැවින් ජ්‍යෙෂ්ඨත්වය සහ වෛද්‍ය පර්යේෂණ ආයතනයෙහි සේවය කරන බව සනාථ කරගැනීම පමණක් අවශ්‍ය බවට තීරණය කර ඉදිරිපත් වූ අයදුම්කරු වන පැමිණිලිකාර කේ.ජී. රත්නකුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අයගේ සුදුසුකම් තහවුරු කරගත් බවට දන්වා ඇති බවත් පෙනී යයි.

ඒ අනුව 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2023.05.29 දිනැති ලිපිය මගින් 2023.05.30 වන දින සිට "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පැමිණිලිකරු වන කේ.ජී. රත්නකුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය පත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙලෙස පත්වීම ලබා දීම හේතුවෙන් 2023.03.07 වන දින පැවති මුල් සම්මුඛ පරීක්ෂණයේ දී වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත් මෙම පැමිණිල්ලේ 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අංක HRC/1650/23 දරණ පැමිණිල්ල ගොනු කර ඇති බවත්, කොමිෂන් සභාව විසින් ඊට අදාළ නිර්දේශය 2024.05.30 වන දින ලබා දෙමින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය පත් කරන ලෙසට නිර්දේශ කර ඇති අතර, එකී නිර්දේශය ප්‍රකාරව 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2024.07.04 දිනැති ලිපිය මගින් 2024.07.04 වන දින සිට ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

මේ හේතුවෙන් මුලින් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර පත්වීම ලබා සිටි කේ.ජී. රත්නකුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ඉහත කී කොමිෂන් සභාවේ නිර්දේශය සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරමින් එකී නිර්දේශය නැවත සලකා බලන ලෙසට ඉල්ලා ඇති අතර, අංක HRC/3159/24 දරණ මෙම පැමිණිල්ල ද ඉදිරිපත් කරමින් පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් ප්‍රකාශ කර

සිටින්නේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා සලකා බලන ලද මූලික සුදුසුකම් ත්‍රිත්වය අතරින් පළමු සුදුසුකම වන 'මෙම ආයතනයේ සේවයේ නියුතු' යනුවෙන් අදහස් කරනු ලබන්නේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු වීම වන බවත්, ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නොව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ සේවයේ නියුතු ආචාර්යවරයෙකු වූ බැවින් ඔහු එකී සුදුසුකම සපුරා නොමැති බවත් ය.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 01-46/2017 සහ 2017.08.24 දිනැති චක්‍රලේඛනය ප්‍රකාරව වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල යනු වෙන් වෙන් ආයතන දෙකක් බවත්, එකී ආයතන දෙක සඳහා LCB0000307 සහ LCB0000588 යනුවෙන් අංක දෙකක් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ. 2025.02.20 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වෛද්‍ය පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් සහභාගී වූ පරිපාලන නිලධාරිතුමිය විසින් ද ප්‍රකාශ කරන ලද්දේ මෙම වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල යන ආයතන දෙක සඳහා වෙන් වෙන්ව අයවැය වෙන් කිරීම් සහ වැය ශීර්ෂයන් පවතින බවයි.

එසේම, 2 වන වගඋත්තරකාර සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) වෛද්‍ය පී. එල්. අතපත්තු මහතා විසින් අංක DDG/LS/GENERAL/445/2024 සහ 2025.03.06 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් සෞඛ්‍ය ලේකම් විසින් 2017 දී නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව සෞඛ්‍ය ආයතන වර්ගීකරණයකට ලක් කර තිබෙන බවත්, එම චක්‍රලේඛයට අනුව වෛද්‍ය පර්යේෂණ ආයතනය හා රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වෙනම ආයතන දෙකක් බව පෙනී යන බවත් සඳහන් කර ඇත. මේ අනුව වෛද්‍ය පර්යේෂණ ආයතනය හා රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වෙනම ආයතන දෙකක් බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

තවද, 4 වන වගඋත්තරකරු විසින් තමාට පෙර ද වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරුන් ලෙස සේවය කළ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් විසින් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත්ව කටයුතු කර ඇති බව ප්‍රකාශ කර ඇත.

2025.02.20 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වෛද්‍ය පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් සහභාගී වූ පරිපාලන නිලධාරිතුමිය විසින් ප්‍රකාශ කරන ලද්දේ 2017 වර්ෂයේදී නිකුත් කරන ලද ඉහත කී චක්‍රලේඛයට පෙර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ සේවයේ නියුතු වූවන් පත් කර තිබුණ ද, එකී චක්‍රලේඛය ක්‍රියාත්මක වීමෙන් පසුව "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කර ඇත්තේ වෛද්‍ය පර්යේෂණ

ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන් අතරින් කෙනෙකු පමණක් බවත් ය.

4 වන වගඋත්තරකරු විසින් ඉහත කී ලෙස වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරුන් ලෙස සේවය කළ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් විසින් "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත්ව කටයුතු කර ඇති බව සනාථ කිරීම සඳහා අශෝක චන්ද්‍රසිරි බන්දුල ජයවර්ධන යන අය වෙතින් ලබාගත් 2024.11.09 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. එකී දිවුරුම් ප්‍රකාශය අනුව අශෝක චන්ද්‍රසිරි බන්දුල ජයවර්ධන යන අය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරයෙකු ලෙස සේවය කළ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයෙක් වන අතර "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත්ව ඇත්තේ 1999 වර්ෂයේදී ය.

2017 වර්ෂයෙන් පසුව "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරයෙකු ලෙස සේවය කළ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයෙකු පත්ව ඇති බවට කරුණු අනාවරණය නොවන බැවින් මෙම තනතුර සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017 දී නිකුත් කරන ලද චක්‍රලේඛනයෙන් පසුව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරුන් පත් කර නොමැති බව තහවුරු වේ.

පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය විසින් සිය අභියාචනය මෙන්ම පැමිණිල්ල තුළින් දක්වා සිටින තවත් කරුණක් වන්නේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා 2023.03.07 වන දින පැවති මුල් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇති ආකාරය නිවරදි නොවන බවයි. එසේ හෙයින් එකී සම්මුඛ පරීක්ෂණයේ දී එක් එක් නිර්ණායකයන් යටතේ සලකා බලන ලද අනුනිර්ණායකයන් සඳහා ලබා දී ඇති ලකුණු ලේඛනය ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාව විසින් සිදු කළ දැනුම්දීමේදී 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(I) සහ 2025.01.07 දිනැති ලිපිය යොමු කරමින් දන්වා ඇත්තේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔවුන්ගේ පහසුව සඳහා පමණක් අදාළ නිර්ණායකයන් යොදාගෙන ඇති බවත්, එම නිර්ණායකයන් සඳහා අයදුම්කරුවන් ලබාගත් ලකුණු කොටස් වශයෙන් ඉදිරිපත් කර නොමැති බවත් ය. 2025.02.20 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ද වෛද්‍ය පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් විසින් එම කරුණම සඳහන් කරමින් ප්‍රකාශ කරන ලද්දේ වෙන් වෙන්ව ලකුණු ලබාදුන් ලේඛනයක් ආයතනය සතුව නොමැති බවයි. මේ අනුව 2023.03.07 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව නිවැරදි ලෙස ලකුණු ලබා දී තිබේ ද යන්න සලකා බැලීමට නොහැකි වීම මත එකී සම්මුඛ පරීක්ෂණය විනිවිදභාවයකින් තොර වූවක් බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ලේ 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය විසින් සිදු කර තිබූ අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව 2024.05.30 වන දින සිය නිර්දේශය ලබා දීමේදී පාදක කොටගෙන ඇත්තේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා 2023.03.07 වන දින පවත්වන ලද පළමු සම්මුඛ පරීක්ෂණයේදී ලබා දී ඇති ලකුණු ය. එහෙත් එකී සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන ලද බවට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සටහන් යොදන ලද ලේඛනය, 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් එකී පැමිණිල්ලට අදාළව වාර්තා ඉදිරිපත් කිරීමේ දී කොමිෂන් සභාව වෙත ලබා දී නොමැති බවත්, ඒ වෙනුවට මුල් අවස්ථාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු නිලධාරීන් විසින් 2023.03.07 වන දින පවත්වන ලද පළමු සම්මුඛ පරීක්ෂණයේදී ලබා දී ඇති ලකුණු අනුමත කරමින් ඇතුළත් කරන ලද සටහන් සහිත ලිපියක් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බවත් අනාවරණය වී ඇත. කෙසේවතත් 2025.02.20 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් විසින් 2023.03.07 වන දින පැවති සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන ලද බවට වන නිවරදි ලේඛනය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බැවින් තවදුරටත් අවලංගු වූ සම්මුඛ පරීක්ෂණයක ලකුණු අදාළ කරගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2023.05.29 දිනැති ලිපිය මගින් 2023.05.30 වන දින සිට "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය පත් කර ඇත්තේ එක් වසරක කාල සීමාවකට වන අතර එම වසර අවසානයේ දී කාර්ය සාධනය ඇගයීමට ලක් කර ඉදිරි කටයුතු සිදු කරන බවට දන්වා ඇත. ඒ අනුව 2024.07.03 වන දින පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අයට අදාළව කාර්ය සාධනයක් සිදු කර ඇති අතර එහිදී පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අයගේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුරෙහි පසුගිය වසරක සේවය සලකා බැලීමේ දී එම රාජකාරී සිදු කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් වාර්තා වී නොමැති බවත්, එම මහතාගේ පැමිණීම සතුටුදායක මට්ටමක පවතින බවත්, ඒ අනුව එම මහතාගේ සේවය සතුටුදායක බව නිර්දේශ කරන බවත් කාර්ය සාධනය සිදු කරන ලද මණ්ඩලය විසින් සඳහන් කර ඇත. කෙසේ නමුත් එකී නිර්දේශ ප්‍රකාරව පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අයගේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුරෙහි සේවය සම්බන්ධයෙන් ගනු ලබන තීරණය පිළිබඳව 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දැනුම්දීමක් සිදු කර නොමැති බැවින් පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අයගේ ඉහත කී පත්වීම් ලිපියෙහි සඳහන් පරිදි වසරක කාල සීමාව අවසන් වීමෙන් පසුව ඔහුගේ සේවය අවසන්ව ඇති බව පැහැදිලි වේ.

එසේම, 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අංක MRI/EB/MLT/2017(1) සහ 2024.07.04 දිනැති ලිපිය මගින් 2024.07.04 වන දින සිට 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කිරීමේදී මුලින් එම තනතුර දැරූ පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය වෙත පිටපතක් යොමු කරමින් ඔහු වෙත පවරා තිබූ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුරට අයත් සියලු රාජකාරී, ලිපි ලේඛන, පරිඝණක මුරපද, යතුරු ආදිය ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෙත විධිමත් පරිදි දින 07ක් ඇතුළත භාරදීමට කටයුතු කරන ලෙසට දන්වා ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා 2023.05.30 වන දින සිට පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය පත් කිරීමේ දී ලබා දී ඇති පත්වීමේ ලිපිය සලකා බැලීමේ දී එක් වසරක කාලයක් සඳහා පත් කරන බවට සඳහන් කර තිබුණ ද, 2024.07.04 වන දින සිට 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය පත් කිරීමේ දී ඔහු හට ලබා දී ඇති පත්වීමේ ලිපිය තුළ එවැනි කාල සීමාවක් සඳහන් කර නොමැති බව ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

මේ අනුව සලකා බැලීමේ දී "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා නිලධාරීන් පත් කරනු ලබන කාල සීමාව සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයක් වෛද්‍ය පර්යේෂණ ආයතනය සතුව නොමැති බව ද තහවුරු වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු අනුව සලකා බැලීමේ දී වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ දැන්වීම තුළ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා අදාළ වන මූලික සුදුසුකම් ලෙස මෙම ආයතනයේ සේවයේ නියුතු, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, පළමු ශ්‍රේණියේ පුරුෂ පක්ෂයේ නිලධාරීන් විය යුතු බවට දක්වා ඇති අතර එහි පළමු සුදුසුකම වන මෙම ආයතනයේ සේවයේ නියුතු වීම යන්නෙන් අදහස් වන වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු වීම යන සුදුසුකම 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය සම්පූර්ණ කිරීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වේ.

4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නොව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ සේවයෙහි නියුතු ආචාර්යවරයෙකි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 01-46/2017 සහ 2017.08.24 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසල යනුවෙන්

වෙන් ආයතන දෙකක් බව 2 වන වගඋත්තරකරු වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) වෛද්‍ය පී. එල්. අතපත්තු මහතා විසින් අංක DDG/LS/GENERAL/445/2024 සහ 2025.03.06 දිනැති වාර්තාව මගින් දක්වා ඇත.

ඉහත සඳහන් බොහෝ කරුණු අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව පැවති පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් නොවූ අතර, නැවත සලකා බැලීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු මගින් එම අනාවරණය කර ඇත.

**මේ අනුව 4 වන වගඋත්තරකාර ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම මත එම තනතුර දැරීම සඳහා සුදුසු නොවන බව අදාළ කරුණු අනුව නිරීක්ෂණය වන බැවින් අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කිරීමට කටයුතු කළ යුතු බවට ලබා දී ඇති 2024.05.30 දිනැති නිර්දේශය මෙයින් බලරහිත කරනු ලැබේ.**

එසේම, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පළමුවරට 2023.03.07 වන දින පැවති සම්මුඛ පරීක්ෂණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවලංගු කර ඇති බැවින් ද, දෙවනවරට 2023.05.29 වන දින පැවති සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණය ප්‍රකාරව පැමිණිලිකාර කේ. ජී. රත්න කුමාර (ජී. ආර්. කේ. කළුගම්පිටිගේ) යන අය "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කර ඇත්තේ 2023.05.30 වන දින සිට එක් වසරක කාල සීමාවකට වන බැවින් මේ වන විට එකී කාලසීමාව අවසන්ව ඇති බැවින් ද, අංක HRC/1650/23 දරණ පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජී.ජී.කේ. විද්‍යාරත්න යන අය වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා පත් කිරීමට කටයුතු කළ යුතු බවට ලබා දී ඇති 2024.05.30 දිනැති නිර්දේශය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කර ඇති බැවින් ද වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම්ලත් තැනැත්තෙකු පත් කිරීම වඩාත් සුදුසු බව ද නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

**1.** "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා නැවත අයදුම්පත් කැඳවා විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසු නිලධාරියෙකු පත් කරගැනීමට 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කළ යුතු ය.

2. වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා නිලධාරීන් පත් කිරීමට අදාළව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දැනුවත් කිරීමටත්, එක් එක් නිර්ණායකයන් සඳහා වෙන් වෙන් වශයෙන් ලබා දී ඇති ලකුණු ඇතුළත් ලේඛනය ලබාගැනීමටත් 3 වන වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කළ යුතු ය.

3. කෙසේ වෙතත් ඉදිරියේ දී වෛද්‍ය පර්යේෂණ ආයතනයේ "නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ" තනතුර සඳහා නිලධාරීන් පත් කිරීමට අදාළව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට 1 වන වගඋත්තරකාර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතු ය.

2025. 08 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| එල්.ටී.බී දෙහිදෙණිය, | නිමල් ජී. පුංචිහේවා, |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික), | කොමසාරිස්, |
| සභාපති, | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | |
| විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>කොමසාරිස්<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

පිටපත :- අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10